**දුරකථන**/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

..........................

ඊමේල්/ஈ – மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**கல்வி அமைச்சு**

**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/3/අති.ලේ/සැලසුම්/112

දිනය / திகதி / Date } 2012/05/..

## චක්‍රලේඛ අංක :- 2012/15

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
ද්විතීයික පාසල් 1000 සහ උතුරු පළාත් ද්විතීයික පාසල් 400 සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන කෙරෙන පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**ප්‍රාථමික පාසල් 5000ක් පෝෂණය සඳහා වූ ද්විතියික පාසල් 1000ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩ සටහනට අයත් ද්විතියික පාසල් 1000ක් සහ උතුරු පළාතේ ද්විතියික පාසල් 400ක් සඳහා ලබා දෙනු ලබන පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන (School Development & Maintenance Grant) - [SDMG] ඵලදායි අයුරින් භාවිතයට ගැනීම.**

### 1. හැඳින්වීම

ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට යෝජිත ද්විතීයික පාසල් හා උතුරු පළාතේ ද්විතීයික පාසල් 400ක් සඳහා ආසියානු සංවර්ධන බැංකු ආධාර මත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියෙහි මූල්‍ය ආයෝජන යොදා ගනිමින් පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානයක් - [SDMG] 2012 වසරේ සිට වාර්ෂිකව ව්‍යාපෘති කාල සීමාව තුළ දී ලබා දීමට තීරණය කර ඇත.

මේ යටතේ 2012 වර්ෂයේ දී මෙම වැඩසටහනට තෝරා ගෙන ඇති එක් ද්විතීයික පාසලක් සඳහා උපරිමය රුපියල් 100,000.00කට (එක් ලක්ෂයකට) සීමාවන පරිදි මූල්‍ය ප්‍රදානයක් <u>අවසාන ගෙවීමක් (Outright Grant)</u> වශයෙන් ලබා දෙනු ඇත. මෙම මූල්‍ය ප්‍රදානය පාසලේ අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් බැංකු ගිණුමට බැර වන පරිදි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ කලාප අධ්‍යාපන කාර්යාල මගින් මෙම වැඩසටහනට අයත් පාසල් සඳහා පමණක් සීමාවන පරිදි ලබා දෙනු ලැබේ.

2013 වර්ෂයේ දී මෙම මූල්‍ය ප්‍රදානය ලබා දෙනු ලබන්නේ 2012 වර්ෂයේ එක් එක් පාසලේ මෙකී මූල්‍ය ප්‍රදානයේ ආයෝජන ප්‍රගති මට්ටම අනුවය. එහිදී අවම වශයෙන් 95%කට වඩා වැඩි ආයෝජන කාර්ය සාධනයක් පෙන්නුම් කරන පාසල් සඳහා රු : 100,000.00ක උපරිමයකට යටත්ව පහත පරිදි අනුපාතිකව මෙම මූල්‍ය ප්‍රදානය අදාළ පාසල් වෙත ලබා දිය යුතුවේ.

| වර්ෂ අවසාන ආයෝජන ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස) | ඉදිරි වර්ෂය සඳහා පාසල හිමිකම් ලබන ප්‍රදානය (මූලික ප්‍රදානයේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|
| 95% ට වැඩි | 100% ක ප්‍රදානයක් |
| 85%ට වැඩි - 95% දක්වා | 80% ක ප්‍රදානයක් |
| 75%ට වැඩි - 85% දක්වා | 70% ක ප්‍රදානයක් |
| 65%ට වැඩි - 75% දක්වා | 60% ක ප්‍රදානයක් |
| 55%ට වැඩි - 65% දක්වා | 50% ක ප්‍රදානයක් |
| 50%ට වැඩි - 55% දක්වා | 40% ක ප්‍රදානයක් |
| 50% හෝ ඊට අඩු | ප්‍රදානය සඳහා හිමිකම් නොලබයි |

පාසල් මට්ටමේ ආයෝජන කාර්ය සාධන මට්ටම (Performance Based Funding) අනුව පාසල වෙත ලබා දෙනු ලබන මෙම ආයෝජන අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලවන පරිදි පාසලේ සමස්ත සංවර්ධන සැලසුමට අනුගතව 2012 වර්ෂය තුළදී ම උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවෙන් යුතුව යොදා ගනිමින් පාසල් අලුත්වැඩියා හා නඩත්තු කටයුතු ඉටුකර ගැනීම සඳහා යොදවා ගැනීමට ක්‍රියා කිරීම ඒ ඒ පාසලේ විදුහල්පතිගේ වගකීම වේ.

මේ සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන පරිදි පාසල් මට්ටමින් සකසනු ලබන ක්‍රියාත්මක සැලසුමකට අනුකූලව හා පාසල් මට්ටමින් පිහිටුවා ගනු ලබන මිලදී ගැනීම් හා ඇගයීම් කමිටු ඔස්සේ නිසි පරිදි කටයුතු කළ යුතුය. <u>මෙම ප්‍රදානයට අදාළ සියලු කටයුතු අධීක්ෂණය හා නියාමනය</u> අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, පළාත් ව්‍යාපෘති කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් අඛණ්ඩව සිදුකළ යුතුය.

## 2. <u>මූල්‍ය ප්‍රදානය ලබාදීමේ අරමුණ</u>

මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කරනු ලබන ද්විතීයික පාසල් 1400 තුළ ඒවායේ පාසල් පිරියතට අදාළ අත්‍යාවශ්‍ය වූ සියලු ම නඩත්තු හා අලුත්වැඩියාවන් පාසල් මට්ටමින්ම අප්‍රමාදව ඉටුකරලීමට අවැසි තීරණ ගත හැකි වන පරිදි පාසල බලාත්මක කරලීම මෙහි මූලික අරමුණයි. එමෙන් ම මෙකී නඩත්තු හා අලුත්වැඩියාවන් අඛණ්ඩව සිදු කරමින් පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සිදුකිරීමත් පාසල් පරිශ්‍රය ගුරුවරුන් හා සිසුන් සඳහා ප්‍රියජනක වාතාවරණයක් සහිත ස්ථානයක් බවට පත් කිරීමත්, දැනටමත් පාසල් වෙත ලබා දී ඇති හා ඉදිරියේදී ලබා දෙනු ලබන <u>භෞතික සම්පත් උපරිම ඵලදායීතාවෙන් යුක්තව දිගුකාලයක් තිස්සේ ඉතා අරපරිස්සමෙන් භාවිතයට ගැනීම හා පවත්වා ගැනීම</u> සඳහා පාසලට සහාය වීමත්, එවැනි පාසල් වාතාවරණයක් /සංස්කෘතියක් නිර්මාණය කරලීමත් මෙම ප්‍රදානය ලබා දීමේ ප්‍රමුඛතම අරමුණ වේ.

| |
|---|
| මෙහිලා පාසල අවශ්‍ය සැලසුම් සකස් කරමින් සුදුසු පරිදි බලගැන්වීමත්, මෙම ආරම්භක මූල්‍යමය නඩත්තු අරමුදල් (<u>Initial Maintenance Fund</u>) පදනම මත නැගී සිටිමින් පාසල් සිය ප්‍රජා දායකත්වයන් ලබා ගැනීම හා ප්‍රාදේශීය සම්පත් දායකත්වයන් ලබා ගැනීම වැනි විවිධ උපක්‍රමික ප්‍රවේශයන් තුළ මෙම මූල්‍ය ප්‍රදානය, එහි මූල්‍යමය වටිනාකම මෙන් දෙතුන්ගුණයක ප්‍රබල වටිනාකමක් ඇති ආයෝජනයක් බවට පත් කරමින් භාවිතා කිරීමද අරමුණු කෙරේ. මේ සඳහා පාසල් විදුහල්පතිවරයා ප්‍රමුඛ අදාළ පාර්ශවයන්ගේ නිර්මාණශීලී දායකත්වය හා කැපවීම ලබා දීම අනිවාර්ය අවශ්‍යතාවක් බව සැලකිය යුතුය. |

3. **පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන පාසල් වෙත, නිදහස් කිරීම**

ඒ අනුව මෙම පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන අවසාන ගෙවීමක් (Outright Grant) වශයෙන් 2012 වසරේ සිට ව්‍යාපෘති කාල සීමාව තුළ සෑම වසරකදී ම අදාළ පාසල වෙත ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ඇත. මෙම මූල්‍ය ආයෝජන නිසි පරිදි භාවිත කිරීම තව දුරටත් සහතික කරනු සඳහා ඒ ඒ පාසල විසින් පළාත් ව්‍යාපෘති කළමනාකරු වෙතින් මෙම මූල්‍ය ප්‍රදානය ලබා දෙන ලෙස ලිඛිත ඉල්ලීමක් කළ යුතුය. මෙම මූල්‍ය ප්‍රදාන නිසි පරිදි දියත් කිරීම සඳහා පාසල් මට්ටමින් වාර්ෂිකව ක්‍රියාත්මක සැලසුමක් සකස් කර ගත යුතුය.

තම පළාතට අයත් පාසල්වලට පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන ලබා දීම සඳහා ද්විතීයික පාසල් 1000ට අයත් වන තම පළාතේ පාසල් සහ උතුරු පළාතේ ද්විතීයික පාසල් 400 සහිත පාසල් නාම ලේඛනය (ජාතික පාසල් ද ඇතුළුව), පාසල් ලිපිනය, සංගණන අංකය හා පාසල් අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් බැංකු ගිණුමේ ගිණුම් අංකය, බැංකු ශාඛාවේ විස්තර ද සහිත ලේඛනයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වෙත ලබා දීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

කිසියම් සාධාරණ හේතුවක් මත මූල්‍ය ප්‍රදානය පාසලට ලබා දීම අදාළ වසරේ අප්‍රේල් මස 30 දිනට වඩා ප්‍රමාද වුවහොත් වර්ෂ අවසාන ආයෝජන ප්‍රගතිය සලකා බැලීමේදී අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31දින නොව ඊළඟ වර්ෂයේ ජනවාරි මස 31 දින දක්වා කාලය දීර්ඝ කළ යුතුය.

4. **පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන, ඵලදායි ලෙස ආයෝජනය කිරීම**

මෙම මූල්‍ය ප්‍රදාන වියදම් කිරීමේ දී අධ්‍යාපන ලේකම්ගේ, අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිලට ගැනීම හා බෙදා හැරීම මැයෙන් යුත් අංක HRD/PPM/2002/30 හා 2002/12/04 දින දරණ චක්‍රලේඛ විධිවිධාන සහ එයට පසුව එකතු කරන ලද 2003/11/20 දින දරණ සංශෝධනය, අංක 2006/16 හා 2006/03/21 දින දරණ සංශෝධන සුදුසු පරිදි යොදා ගත යුතුය.

| |
|---|
| එසේ වුව ද, මෙම වැඩසටහන යටතේ තෝරා ගත් ද්විතීයික පාසල් 1400ක් සඳහා වාර්ෂිකව ලබා දෙන මෙම පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානය, පාසල් මට්ටමින් ආයෝජනය කිරීමේ දී ඉහත කී චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනයන්ට වැඩිමනත් වශයෙන් මෙම චක්‍රලේඛයේ දක්වන විධිවිධාන හා උපදෙස් ද අදාළ කරගත යුතුය. |

ඉහත අංක 2002/30 දරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 03 වගන්තියේ දැක්වෙන අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් ගණයට නොවැටෙන එහෙත්, විශේෂයෙන් මෙහි පහත දක්වා ඇති කාර්යයන් සඳහා ද 2012 වසරේ සිට ලබා දෙනු ලබන මෙම පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන යොදා ගැනීමට අදාළ පාසල්වල විදුහල්පතිවරුන්ට මෙයින් බලය පවරනු ලැබේ.

(අ) පාසල් ලී බඩු හා විවිධ උපකරණ අලුත්වැඩියාව (Repairing of School Furniture and Various Equipment)

(ආ) අභ්‍යන්තර විදුලි පද්ධතිය සකස් කිරීම, අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු (Internal-Installation of Electricity Facilities, Repairs and Maintenance)

(ඇ) අභ්‍යන්තර පානීය ජල පද්ධතිය සකස් කිරීම, අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු (Drinking Water Supply, Repairs and Maintenance)

(ඈ) සනීපාරක්ෂක පහසුකම් සකස් කිරීම, නඩත්තුව හා අලුත්වැඩියාව (Sanitary Services Supply, Maintenance and Repairs)

(ඉ) පාසල් ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු - වාර්ෂිකව රුපියල් 30,000/-ක උපරිමයකට යටත් ව (Repairs and Maintenance of School Buildings)

(මෙහි දී පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථාන, විද්‍යාගාර, පන්ති කාමර, බහුමාධ්‍ය ඒකක, ක්‍රියාකාරී කාමර හා පුස්තකාල සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු වේ.)

(ඊ) පාසල් වත්ත අලංකරණය හා පවත්වා ගැනීම සඳහා - වාර්ෂිකව රු:10,000/-ක උපරිමයකට යටත්ව.

(උ) අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු ඉටු කිරීමට අවශ්‍යවන අවම උපකරණ කට්ටලයක් මිලදී ගැනීමට. (පාසල් ගොඩනැගිලි මනා තත්ත්වයෙන් පවත්වා ගෙන යාම පිළිබඳ උපදෙස් සංග්‍රහයේ හඳුන්වා දී ඇති උපකරණ සඳහා ප්‍රමුඛතාව දෙමින්)

ඉහත සඳහන් අයිතමයන් අතරින් හැකි උපරිම ප්‍රමාණයක් ආවරණය වන පරිදි පාසල විසින් සැලසුම් සකස් කිරීම වඩාත් උචිත වේ.

(මෙහිදී මෙම චක්‍රලේඛයේ 05වන වගන්තියේ දක්වා ඇති පරිදි මෙම ප්‍රදානය යොදා ගත නොහැකි අයිතම කෙරෙහිද ඔබ විශේෂ අවධානය යොමු කළ යුතුය.)

ඉහත කටයුතු ඉටුකරලීම පහසු කරනු සඳහා අදාළ කර ගත හැකි, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දැනටමත් නිකුත් කර ඇති, <u>"පාසල් ගොඩනැගිලි මනා තත්ත්වයෙන් පවත්වා ගැනීම"</u> යන මැයෙන් යුතු උපදෙස් සංග්‍රහයේ පිටපතක් ද මේ සමඟ ඔබට ලබා දී ඇත. ඒ අනුව සුදුසු පරිදි එහි දැක්වෙන උපදෙස් ද යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

එහෙත්, ඒ අනුව හුදෙක් ඉහත කී උපදෙස් සංග්‍රහයටම පමණක් සීමා නොවී ඉන් ඔබ්බට ද දිවෙන සේ පාසලට ක්‍රියා කළ හැකිය.

ඉහත සඳහන් අයිතම හෝ ඊට අමතරව සිදු කළ යුතු යැයි පාසල් මට්ටමින් තීරණය කෙරෙන අයිතම හෝ ක්‍රියාදාමයන් වලදී, අවශ්‍ය වෙතොත් පළාත් හෝ කලාප මට්ටමේ හෝ ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී සහාය ලබා ගැනීමට පාසලට කටයුතු කළ හැකිය.

පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන ආයෝජන වැඩසටහන පිළිබඳ පාසල් මට්ටමට දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අධ්‍යාපන, ගිණුම්කරණ, විගණන හා ඉංජිනේරු සම්පත් පුද්ගල දායකත්වය හැකි සෑම අවස්ථාවකදී ම ලබාගත යුතුය.

## 5. පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන යොදාගත නොහැකි අයිතම

පහත සඳහන් අයිතම සඳහා පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන භාවිත කළ නොහැකි ය.

| | | | |
|---|---|---|---|
| i. | දුරකථන බිල්පත් ගෙවීම | ii. | ජල බිල්පත් ගෙවීම |
| iii. | විදුලි බිල්පත් ගෙවීම | iv. | ආරක්ෂක සේවා සඳහා ගෙවීම |
| v. | නව ගොඩනැගිලි ඉදිකිරීම | vi. | රථ වාහන මිල දී ගැනීම, නඩත්තුව හා අලුත්වැඩියාව |
| vii. | සෘජු වැටුප් හා වේතන ගෙවීම | viii. | සමරු තිළිණ/සමරු ඵලක/උපහාර තිළිණ, ආරාධනා පත් මුද්‍රණය, උත්සව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම |
| ix. | පාසල් ලිබඩු අලුතින් මිලදී ගැනීම | | |

එමෙන් ම අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් සඳහා දැනටමත් පාසල් වෙත ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදනවලින් මිලදී ගත හැකි අයිතම මිලට ගැනීමට මෙම මූල්‍ය ආයෝජන යොදා ගැනීමෙන් වැලකිය යුතුය.

## 6. පාසල් මිලදී ගැනීම් කමිටුව සහ පාසල් ඇගයීම් කමිටු ක්‍රියාකාරිත්වය

2002/30 දරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 07 වගන්තියේ දැක්වෙන කමිටු මෙහි දී ද අදාළ වේ. එසේ වුව ද, ඉහත අංක 'අ', 'ආ', 'ඇ', 'ඈ', 'ඉ', 'ඊ' , 'එ' හි සඳහන් අමතර කටයුතු ඉටු කිරීමේ දී පාසල් මිලදී ගැනීම කමිටුව සහ ඇගයීම් කමිටුව ශක්තිමත් කිරීම සඳහා සුදුසු පරිදි එකී ශීර්ෂ හා සම්බන්ධ දැනුම සහිත දෙමාපිය නියෝජිතයකු ද සහභාගී කරවා ගත යුතු වේ. <u>මේ අනුව අවම පිරිවැයක් යටතේ උසස් පිරිවිතරයකින් යුතු අලුත්වැඩියා හා නඩත්තු, සේවා හා භාණ්ඩ සැපයුම් මිල දී ගැනීමට උක්ත කමිටු විසින් වග බලා ගත යුතු වේ</u>. එමෙන්ම පළාතේ පවත්නා සාධාරණ මිළ ගණන්වලට ගැළපෙන අයුරින් මූල්‍ය කටයුතු සිදු කිරීම සඳහා ද අවධානය යොමු විය යුතුය.

## 7. <u>ගිණුම් ගත කිරීම</u>

### වැය විෂය, වැය ලෙජරය, සිවුමස් ගිණුම් සාරාංශය

වැය විෂය අංක 126-2-10-17-2401 අනුව හා පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන වැය විෂය මාතෘකාව යටතේ මෙම ප්‍රතිපාදන පාසලට ලබා දෙනු ඇත. ඒ අනුව වැය ලෙජරය නඩත්තු කිරීම අවශ්‍ය වේ. එමෙන් ම, අංක 2002/30 දරන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 22හි සඳහන් පරිදි සකස් කරනු ලබන සිවුමස් ගිණුම වාර්තාවට පාසල් සංවර්ධන නඩත්තු මූල්‍ය ප්‍රදාන වැය විෂය යටතේ කරන ලද වියදම් ද ඇතුලත් කර එම වාර්තා කලාප හා පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත නිසි පරිදි යැවිය යුතු ය.

රේඛීය අමාත්‍යාංශ පළාත් හා කලාප මට්ටමේ ගණකාධිකාරීවරුන් විසින් මෙම මූල්‍ය ප්‍රදානය කළමනාකරණය කිරීම පිළිබඳව කලින් කලට පාසල් ප්‍රධානීන් හා වැඩසටහන භාර ගුරුභවතා නිසි ලෙස දැනුවත් කරමින් ප්‍රතිපෝෂණය ලබා දීමට විශේෂයෙන් ක්‍රියා කළ යුතු වේ.

## 8. පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානය පිළිබඳ ඉදිරිපත් කළ යුතු කාර්තුමය මූල්‍ය ප්‍රගති, සහ නියාමන වාර්තා

### 8.1. පාසල් මට්ටම - මූල්‍ය ප්‍රගති වාර්තාව හා වියදම් සාරාංශය

පාසල් මට්ටමේ මූල්‍ය ප්‍රගති වාර්තාව සහ වියදම් සාරාංශය අදාළ පාසලේ විදුහල්පති විසින් මෙම චක්‍රලේඛය සමඟ අමුණා එවා ඇති <u>ආකෘති 01 හා 02 හි</u> දැක්වෙන පරිදි සකස් කරනු ලබන මූල්‍ය ප්‍රගති වාර්තාව හා ආයෝජන අයිතම දැක්වෙන වියදම් සාරාංශය පාසල අයත් පළාතේ ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ පළාත් සම්බන්ධීකරණ නිලධාරී හා EKSP පළාත් ව්‍යාපෘති කළමනාකරු වෙත සෑම කාර්තුවක් අවසානයේදීම එළඹෙන ඊළඟ මාසයේ 10 වෙනි දිනට පෙර එවිය යුතු වේ.

ජාතික පාසල් ද ඇතුළුව තම පළාතට අයත් ද්විතීයික පාසල්, මෙම චක්‍රලේඛ විධිවිධාන හා ඊට ආනුශාංගික අනෙකුත් උපදෙස් වලට අනුව අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් පාසල් මට්ටමේ සමස්ත සංවර්ධන සැලැස්ම තුළ අන්තර්ගත කොට ඇති බවටත්, ඒවා නිසි කලට ක්‍රියාත්මක කොට ඇති බවටත් <u>නියාමනය සහ අධීක්ෂණය කිරීමට පළාත් සම්බන්ධීකරණ නිලධාරී හා EKSP පළාත් ව්‍යාපෘති කළමනාකරු විසින් විශේෂයෙන් වගබලා ගත යුතුවේ.</u>

8.2. **පළාත් මට්ටම - කාර්තුමය මූල්‍ය ප්‍රගති වාර්තාව**

EKSP පළාත් ව්‍යාපෘති කළමනාකරු විසින් මෙම චක්‍රලේඛය සමඟ අමුණා එවා ඇති <u>ආකෘති අංක 03</u> අනුව සකස් කරනු ලබන පළාත් මට්ටමේ මූල්‍ය ප්‍රගති වාර්තාව සෑම කාර්තුවක් අවසානයේදීම එළඹෙන ඊළඟ මාසයේ 25 වැනි දිනට පෙර දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ ගණක ධිකාරී වෙත එවිය යුතුය.

මීට අමතරව EKSP පළාත් ව්‍යාපෘති කළමණාකරු විසින් තම පළාතට අයත් ද්විතීයික පාසල් සඳහා ලබාදෙන මෙම පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානය පාසල වෙත ලද බව සනාථ කිරීමට <u>ආකෘතිය අංක 04</u> අනුව "සී 100" සාරාංශ ලේඛනයක් ද සකස් කොට ප්‍රධාන ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය වෙත වාර්ෂිකව එවිය යුතුය. මීට අමතරව <u>ආකෘති අංක 05</u> යටතේ වර්ෂ අවසානයේදී ඊළඟ වසරට අදාළ මූල්‍ය ප්‍රදාන ලබා ගැනීමේ ඉල්ලීම ද නිසි පරිදි සම්පූර්ණ කර එවිය යුතුය.

8.3. **කලාප මට්ටම - සිවුමස් ගිණුම් වාර්තාව**

අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් ගිණුමට අදාළව මෙම අරමුදල සඳහා ද කලාප කාර්යාලය වෙත සිවුමස් ගිණුම් වාර්තා ගෙන්වා ගැනීමටත් ඒ අනුව පාසල් මට්ටමට අදාළ සියලුම පසුවිපරම් හා ප්‍රතිපෝෂණය ලබා දීමත් කළ යුතුය.

9. **නියාමනය**

මෙම මූල්‍ය සම්පත් ඵලදායි හා ප්‍රශස්ත අයුරින් පාසල් තුළ ආයෝජනය කිරීම හා එමගින් අපේක්ෂිත උසස් ප්‍රතිඵලයන් ලඟා කරවාලීම සහතික කරනු වස් දැනටමත් ක්‍රියාත්මක අංක 2002/30 දරණ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි නියමකොට ඇති නියාමන ක්‍රියාමාර්ගවලට අමතරව පහත සඳහන් පරිදි වැඩිමනත් නියාමන කටයුතු සිදු කිරීම කෙරෙහි ද ඔබගේ අවධානය යොමු විය යුතු ය.

i. පාසල් මට්ටම - අභ්‍යන්තර නියාමනය විදුහල්පති විසින් (පාසල් සැලසුම් / කළමනාකරණ කමිටුව මගින්)

ii. කොට්ඨාස මට්ටම - කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිය පාසල් අධීක්ෂණයේදී.

iii. කලාප මට්ටම - කලාප අධ්‍යාපන සැලසුම් විෂයභාර නි.අ.අ./ස.අ.අ. කලාපයේ ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරී විසින්.

iv. පළාත් මට්ටම - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ යටතේ ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන භාර නිලධාරී සහ දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ පළාත් ව්‍යාපෘති කළමනාකරු විසින්

v. රේඛීය අමාත්‍යාංශය - ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ, දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමිති හා කළමනාකරණ ඒකකය, ජාතික පාසල් අංශය, ගිණුම්කරණ අංශ නිලධාරීන් හා පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ විසින්.

## 10. මූල්‍ය ආයෝජනය විගණනය

අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් මට්ටමේ විගණන නිලධාරීන් විසින් මෙම මූල්‍ය ආයෝජන පාසල් මට්ටමින් යෙදවීම පිළිබඳව කලින් කලට සොයා බලමින් පාසල් බලාත්මක කිරීම සඳහා වූ මෙම ප්‍රයත්නයෙහි සාර්ථකත්වයට අනුබල දිය යුතුය.

මෙම විශේෂිත මූල්‍ය ප්‍රදාන පහසුකම, නිසි කාල සීමාව තුළදී ප්‍රශස්ත අයුරින් ආයෝජනය කිරීමට අපොහොසත් වුවහොත් ඒ පිළිබඳව පාසල් ප්‍රධානීන්ගෙන් කරුණු විමසිය හැකිය.

## 11. විශේෂ අවස්ථා

මෙම චක්‍රලේඛයේ විශේෂයෙන් උපදෙස් සඳහන්ව නොමැති අවස්ථාවන් පිළිබඳව ක්‍රියා කිරීමේ දී දැනට ක්‍රියාත්මක මූල්‍ය හා පරිපාලන රෙගුලාසි යොදා ගත යුතු වන බව ද වැඩිමනත් වශයෙන් සඳහන් කරමි.

මෙම චක්‍රලේඛය පිළිබඳ වැඩිමනත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වුවහොත් මෙම අමාත්‍යාංශයේ දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ නියාමන හා ඇගයීම් අංශයේ දුරකථන අංක 011-2786703 හෝ ගිණුම් අංශයේ දුරකථන අංක 011-2787104 ඇමතීමට කටයුතු කළ මැනව.

පළාතේ සහ ඒ ඒ කලාපයේ ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරී සහ පළාත් ව්‍යාපෘති කළමනාකරුවන් මෙම පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය පිළිබඳව සිය විශේෂ අවධානය යොමුකරලීම ද අත්‍යාවශ්‍ය බව දන්වමි.

**එච්.එම්. ගුණසේකර,**
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-

01. විගණකාධිපති
02. ලේකම්, මුදල් කොමිසම
03. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
04. සියලුම අතිරේක ලේකම්වරු, අධ්‍යාපන අමාත්‍යාංශය
05. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
06. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
07. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
08. ව්‍යාපෘති අධ්‍යක්ෂ, දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය
09. ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
10. සියලුම පළාත් ව්‍යාපෘති කළමනාකරුවන්
11. පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය
12. පළාත් ප්‍රධාන ගණකාධිකාරී
13. පළාත් ප්‍රධාන ඉංජිනේරු

චක්‍රලේඛ අංක :2012/15 **ආකෘතිය 01**

(විදුහල්පති විසින් සම්පූර්ණ කොට දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ පළාත් ව්‍යාපෘති කළමනාකරු සහ ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ පළාත් සම්බන්ධීකරණ නිලධාරී වෙත යැවීම සඳහා)

ADB EKSP
Education for Knowledge Society Project

| 1 | 2 | 3 |
|---|---|---|
| සිවුමස | සිවුමස | සිවුමස |
| නිවැරදි කොටුව මත √ ලකුණ යොදන්න | | |

## දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය
## ද්විතීයික පාසල්වල – පාසල් මට්ටමේ නඩත්තු ක්‍රියාවලීන් දියත් කිරීම සඳහා ලබාදෙන පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන – SDMG
## වැය කිරීම පිළිබඳ සිවුමස් පාසල් මූල්‍ය ප්‍රගති වාර්තාව

- පළාත : ........................................
- කලාපය : ........................................
- පාසලේ නම : ........................................ ලිපිනය : ........................................
- දුරකථන අංකය : ........................................
- පාසල සඳහා : ........................................ වර්ෂයට වෙන් කළ මුදල : රු. ....................
- පාසලට : ........................................ වර්ෂය සඳහා ලැබුණු මුදල : රු. ................ ගිණුමට බැරවූ දිනය ..............
- පෙර වර්ෂයේ ඉතිරි වී ඇති මූල්‍ය ප්‍රදාන : රු. ..............................
- අප්‍රේල් 30/ අගෝස්තු 31/ දෙසැම්බර් 31 වන විට වැය කළ මුදල : රු. ..............................
- අප්‍රේල් 30/ අගෝස්තු 31/ දෙසැම්බර් 31 වන විට වැය කළ මුදල ලැබුණු මුදලෙහි ප්‍රතිශතයක් වශයෙන් : ..............................
- අප්‍රේල් 30/ අගෝස්තු 31/ දෙසැම්බර් 31 දිනට ඉතිරි මුදල : රු. ..............................

..............................
පාසල් මිල දී ගැනීම් කමිටුවේ
ලේකම්ගේ අත්සන

..............................
විදුහල්පතිගේ අත්සන
නිල මුද්‍රාව

දිනය : ..............................

සෑම වසරකම අප්‍රේල් 30, අගෝස්තු 31, දෙසැම්බර් 31 දිනෙන් අවසන් සිවුමස සඳහා සකස් කර රළඟ මස 10 දිනට පෙර ඔබගේ පාසල අයත් පළාතේ පළාත් ව්‍යාපෘති කළමනාකරු සහ පාසල් පළාත් සම්බන්ධීකරණ නිලධාරී වෙත යැවිය යුතුයි.
(අනවශ්‍ය වචන කපා හරින්න.)

චක්‍රලේඛ අංක : 2012/15 **ආකෘතිය 02**

(විදුහල්පති විසින් සම්පූර්ණ කොට දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ පළාත් ව්‍යාපෘති කළමනාකරු සහ ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනේ පළාත් සම්බන්ධීකරණ නිලධාරී වෙත යැවීම සඳහා )

ADB EKSP Education for Knowledge Society Project

පළාත : .......................... කලාපය : ........................

පාසල : ..........................................................................

| 1 | 2 | 3 |
|---|---|---|
| සිවුමස | සිවුමස | සිවුමස |
| නිවැරදි කොටුව මත √ ලකුණ යොදන්න | | |

## දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය

## ද්විතීයික පාසල්වල පාසල් මට්ටමේ නඩත්තු ක්‍රියාවලීන් දියත් කිරීම සඳහා ලබාදෙන පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන - (SDMG) වැය කිරීම පිළිබඳ සිවුමස් පාසල් මූල්‍ය ප්‍රගති වාර්තාව

## වියදම් සාරාංශය

................................ දිනෙන් අවසන් පළමු/ දෙවන/ තුන්වන කාර්තුව සඳහා (අදාළ නොවන වචන කපාහරින්න)

| අනු අංකය | සංවර්ධන ක්‍රියාවලියට අදාළ වැඩසටහන | ඇස්තමේන්තු කළ මුදල | සත්‍ය වියදම | ඉතිරි මුදල | වෙනත් විස්තර ඇතොත් සඳහන් කරන්න |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| | එකතුව | | | | |

.......................................................................

නියෝජ්‍ය විදුහල්පති
අධ්‍යාපන සංවර්ධන

.......................................................................

විදුහල්පතිගේ අත්සන
නිල මුද්‍රාව

)

දිනය : ..................................................

සෑම වසරකම අප්‍රේල් 30, අගෝස්තු 31, දෙසැම්බර් 31 දිනෙන් අවසන් සිවුමස සඳහා සකස් කර ඊළඟ මස 10 දිනට පෙර ඔබගේ පාසල අයත් පළාතේ පළාත් ව්‍යාපෘති කළමනාකරු සහ පාසල් පළාත් සම්බන්ධීකරණ නිලධාරී වෙත යැවිය යුතුයි.
(අනවශ්‍ය වචන කපා හරින්න.)

චක්‍රලේඛ අංක : 2012/15 **ආකෘතිය 03**

(දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ පළාත් ව්‍යාපෘති කළමනාකරු විසින් සම්පූර්ණ කොට ව්‍යාපෘති ගණකාධිකාරී වෙත යැවීම සඳහා)

ADB EKSP
Education for Knowledge Society Project

| 1 | 2 | 3 |
|---|---|---|
| සිවුමස | සිවුමස | සිවුමස |
| නිවැරදි කොටුව මත √ ලකුණ යොදන්න | | |

## දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය

## ද්විතීයික පාසල් වල- පාසල් මට්ටමේ නඩත්තු ක්‍රියාවලීන් දියත් කිරීම සඳහා ලබාදෙන පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන – (SDMG) වැය කිරීම පිළිබඳ සිවුමස් පළාත් මූල්‍ය ප්‍රගති වාර්තාව

- පළාත : ..............................................
- පළාත සඳහා ....................................වර්ෂයට වෙන් කළ මුදල : රු. ..................................
- පළාතට ............................................වර්ෂය සඳහා ලැබුණු මුදල : රු. ................................ ගිණුමට බැර වූ දිනය : ................................

................................. දිනෙන් අවසන් පළමු/ දෙවන/ තුන්වන කාර්තුව සඳහා (අදාළ නොවන වචන කපාහරින්න)

| අනු අංකය | කලාපය | පාසල් ගණන | වෙන් කළ මුදල | ආයෝජනය කර ඇති මුළු මුදල | ඉතිරි මුදල | |
|---|---|---|---|---|---|---|
| | | | | | රුපියල් | වෙන් කළ මුදලේ ප්‍රතිශතයක් ලෙස |
| | | | | | | |
| එකතුව | | | | | | |

.........................................................
පළාත් ව්‍යාපෘති කළමණාකරුගේ අත්සන
නිල මුද්‍රාව

.........................................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන
නිල මුද්‍රාව

දිනය : ..........................................

දිනය : ..........................................

සෑම වසරකම අප්‍රේල් 30, අගෝස්තු 31, දෙසැම්බර් 31 දිනෙන් අවසන් සිවුමස සඳහා සකස් කර රළඟ මස 25 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යංශයේ ව්‍යාපෘති ගණකාධිකාරී වෙත යැවිය යුතුයි.
(අනවශ්‍ය වචන කපා හරින්න.)

චක්‍රලේඛ අංක : 2012/15 ආකෘතිය 04

(දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ පළාත් ව්‍යාපෘති කළමනාකරු විසින් සම්පූර්ණ කොට ව්‍යාපෘති ගණකාධිකාරී වෙත යැවීම සඳහා)

ADB EKSP
Education for Knowledge Society Project

## දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය

## ද්විතීයික පාසල්වල – පාසල් මට්ටමේ නඩත්තු ක්‍රියාවලීන් දියත් කිරීම සඳහා ලබාදෙන පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදාන - SDMG

## පාසලට ලද බවට සනාථ කිරීමේ "සී 100 කුවිතාන්සි" පිළිබඳ විස්තරය

පළාත : .......................................................

| අනු අංකය | පාසලේ නම | ලිපිනය | පාසල වෙත ලබා දුන් මුදල | සී 100 කුවිතාන්සි | | වෙනත් |
|---|---|---|---|---|---|---|
| | | | | අංකය | දිනය | |
| | | | | | | |

...........................................................
පළාත් ව්‍යාපෘති කළමනාකරුගේ අත්සන
නිල මුද්‍රාව

දිනය : .............................................

...........................................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන
නිල මුද්‍රාව

දිනය : .............................................

(සෑම වසරකම පළමු කාර්තුව නිමවීමට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගණකාධිකාරී වෙත යැවිය යුතුය.)

චක්‍රලේඛ අංක : 2012/15 **ආකෘතිය 05**

(පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සම්පූර්ණ කොට අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ප්‍රවර්තන වර්ෂයේ දෙසැ. 31 දිනට පසුව හා රළඟ වර්ෂයේ ජනවාරි 15 දිනට පෙර එවිය යුතුය.)

ADB EKSP
Education for Knowledge Society Project

## දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය

## ද්විතීයික පාසල්වල – පාසල් මට්ටමේ නඩත්තු ක්‍රියාවලීන් දියත් කිරීම සඳහා ලබාදෙන පාසල් සංවර්ධන හා නඩත්තු මූල්‍ය ප්‍රදානය - SDMG

## ..................... වර්ෂය සඳහා පළාත් මට්ටමේ ආයෝජන නිර්දේශය

පළාත : ..........................................................

| අනු අංකය 01 | පාසලේ නම 02 | ලිපිනය 03 | පාසලේ සංගණන අංකය 04 | විශේෂ සංවර්ධන මූල්‍ය ප්‍රදාන ආයෝජන ප්‍රගතිය 05 | | 95% ආයෝජන සීමාව කරා ලගාවීමට මෙම පාසල අපොහොසත් වී ඇති බැවින් ඒ අනුව සුදුසු පරිදි අවම ප්‍රදානයක් ලබාදීමේ නිර්දේශය 06 |
|---|---|---|---|---|---|---|
| | | | | මුදල | ප්‍රතිශතය | |
| | | | | | | |

.......................................................
පළාත් ව්‍යාපෘති කළමනාකරුගේ අත්සන
නිල මුද්‍රාව

දිනය : ..........................................................

.......................................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
නිල මුද්‍රාව

දිනය : ..........................................................

(චක්‍රලේඛයේ අංක 01 පරිච්ඡේදයේ සඳහන් පරිදි පාසලේ වර්ෂ අවසාන ආයෝජන ප්‍රගති මට්ටම අනුව මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය)

| | Policy Requirement | MOE | NIE | DOE | EPD | NLDSB |
|---|---|---|---|---|---|---|
| 30104 | The official website of the organization is compliant to the “web standards and guidelines” published by ICTA | | | | | |
| 30105 | The official website of the organization is trilingual | | | | | |
| 30107 | The official website of the organization is supported by open standard based content management system | | | | | |
| 30108 | Government organization has appointed 'Content Management Team' (CMT) to approve the content on this website | | | | | |
| 30116 | The official website of the organization is interactive and responsive to web based requests | | | | | |
| 30117 | The official website of the organization has been audited for information security | | | | | |
| 30201 | Government organization is registered under gov.lk domain | | | | | |